සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமைEyடையது
All Rights Reseved

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
## Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2016 ජුලි | 10 ශ්‍රේණිය
இரZd`M தவணைப் பரீட்சை 2016 | தரம் - 10
**Second Term Test – 2016 July** | **Grade - 10**

ගණිතය II
கணிதம் II
**Mathematics II**

පැය තුනයි
3 மணித்தியாலம
**3 Hours**

- **A කොටසින් ප්‍රශ්න 5 කුත්, B කොටසින් ප්‍රශ්න 5 කුත් ලෙස ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 ක් හිමි වේ.**

### A - කොටස

**01. (i)** දර්ශක ආකාරයෙන් දක්වන්න.

$\log_2 64 = 6$

**(ii)** $\log_a 5$ හා $\log_a 3$ ඇසුරින්, $\log_a 45$ ලියා දක්වන්න.

**(iii)** $\log_x 81 = y$ නම්, $x$ හා $y$ ට ගැළපෙන අගය යුගලයක් ලියන්න.

**(iv)** $\log_6 18 + \log_6 10 = \log_6 x + \log_6 5$ විසඳන්න.

**02. (a) (i)** හිස්තැන්වලට සුදුසු පද ලියා දක්වන්න.

$(2x - \ldots..)^2 = 4x^2 - \ldots\ldots + 25$

**(ii)** $x + \frac{1}{x} = 6$ නම්, $x^2 + \frac{1}{x^2}$ හි අගය සොයන්න.

**(b)** සාධක සොයන්න.

**(i)** $6y^2 + y - 15$

**(ii)** $(x + 1)^2 - 49$

**03.** $y = x^2 + 1$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට $x$ හා $y$ හි අගයන් ඇතුළත් අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **x** | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
| **y** | 10 | 5 | …. | 1 | ….. | 5 | 10 |

**(a) (i)** $x = -1$ හා $x = 1$ විට $y$ හි අගයන් සොයන්න.

**(ii)** $x$ අක්ෂය හා $y$ අක්ෂය දිගේ කුඩා කොටු 10 ක් ඒකක එකක් ලෙස ගෙන ප්‍රස්තාරය අඳින්න.

**(b)** ප්‍රස්ථාරය ඇසුරින්,

**(i)** සමමිතික අක්ෂයේ සමීකරණය ලියන්න.

**(ii)** ශ්‍රිතය ධනව වැඩිවන $x$ හි අගය පරාසය ලියන්න.

**(iii)** ප්‍රස්තාරය $y$ අක්ෂය දිගේ ඒකක දෙකක් පහළට විස්ථාපනය කළ විට ලැබෙන නව ප්‍රස්තාරයේ සමීකරණය

සොයන්න.

**04. (a)** $V^2 = u^2 + 2as$ සූත්‍රයෙහි u උක්ත කර V = 20, a = 10 හා s = 15 ආදේශයෙන් u හි අගය සොයන්න.

**(b)** පාසලක ශිෂ්‍යයින්ගෙන් තමා කැමති ක්‍රීඩාවන් පිළිබඳ රැස්කර ගත් තොරතුරුවලින් පිළියෙළකර ගත් තොරතුරු පහත වගුවේ දැක්වේ. මෙම තොරතුරු වට ප්‍රස්තාරයක දක්වන්න.


| **ක්‍රීඩාව** | **සිසුන් ගණන** |
|---|---|
| එල්ලේ | 75 |
| ක්‍රිකට් | 250 |
| වොලිබෝල් | 150 |
| නෙට්බෝල් | 125 |

**05. (i)** ළමා කමිසයක මිල ළමා ගවුමක මිලට වඩා රු. 75 කින් වැඩිය. ළමා කමිස දෙකක් හා ළමා ගවුමක මිල රු. 1425 කි. රු. 5 000 ක් වෙළඳපොලට රැගෙන යන හිරුණිට මිලදී ගත හැකි උපරිම ළමා කමිස හා ළමා ගවුම් ප්‍රමාණය වෙන වෙනම සොයා ඔහු අත ඉතිරි වන මුදල සොයන්න.

**06. (a) (i)** එක දිනකදී P, Q හා R බස් රථ තුනක් බස් නැවතුම්පොළකින් එකවර පිටත් වේ. ඉන් පසු P බස් රථය සෑම පැය $4m$ ට වරක් ද, Q බස් රථය සෑම පැය $m^2n$ ට වරක් ද, R බස් රථය සෑම පැය $8n^2$ කට වරක් ද බස් නැවතුම්පොළෙන් පිටත් වේ. මෙම බස් රථ තුනම නැවත එකවර බස් නැවතුම් පොළෙන් පිටත් වන්නේ පැය කීයකට පසුවද? පිළිතුර වීජීය පදයකින් දක්වන්න

**(ii)** $(a - 2)^2$ ; $(a + 2)(a - 2)$ ප්‍රකාශනවල කු.පො.ගු. සොයන්න.

**(iii)** රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සඳහා ප්‍රකාශනයක් ගොඩනගා සුළු කරන්න.




**(ii)** සුළු කරන්න.

$$\frac{7}{3(p+2)} - \frac{2}{(p+2)}$$

**B - කොටස**

**07. (a) (i)** lg6 = 0.7782 නම්, lg 600 හි අගය සොයන්න.

**(ii)** antilog 1.6732 හි අගය සොයන්න.


**(b)** $\frac{457.1 \times 37.8}{57.81}$ හි අගය ලඝු ගණක වගු භාවිතයෙන් සොයන්න.

**08. (a)** තෙල් බෙදා හරින මධ්‍යස්ථානයක ඉදිකරන ලද ඝනකාභ හැඩැතිතෙල් ටැංකියක දිග 3m, පළල 2m ද, උස 1.5 m ද වේ. මිනිත්තුවට ලීටර් 300 ක ශීඝ්‍රතාවයකින් තෙල් බෙදා හරින්නේ නම් ටැංකියෙන් හරි අඩක් බෙදා හැරීමට ගතවන කාලය මිනිත්තු කියද?

**(b)** A හා B නගර දෙක අතර දුර 320 km වේ. බස් රථයක් A නගරයේ සිට **A** වෙත යාමට $50\ kmh^{-1}$ මධ්‍යක වේගයකින් පෙ.ව. 6 ට පිටත් වේ. ඊට පැය දෙකකට පසු B නගරයෙන් පිටත් වන වෙනත් බස් රථයක් $60\ kmh^{-1}$ මධ්‍යක වේගයෙන් A නගරය දක්වා ගමන් කරයි. බස් රථ දෙක එකිනෙකට හමු වන වේලාව සොයන්න.

**09.** PQRS සමාන්තරාස්‍රයේ Q හා S ලක්ෂ්‍යවල සිට PR විකර්ණයට අඳින ලද ලම්බ QX හා SY වේ. මෙම තොරතුරු රූප සටහනක ඇතුළත් කර QXSY සමාන්තරාස්‍රයක් බව සාධනය කරන්න.

**10.** ABC සමද්වීපාද ත්‍රිකෝණයකි. AB = BC වේ. $A\hat{B}C$ කෝණ සමච්ඡේදකය AC පාදය D හිදී හමුවේ.




**(i)** මෙම රූපය ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන ඉහත තොරතුරු ලකුණු කරන්න.

**(ii)** AD = DC බව පෙන්වන්න.

**(iii)** $AC \perp BD$ බව සාධනය කරන්න.


**11.** PQRS චතුරස්‍රයේ $Q\hat{R}S = Q\hat{P}S$ ද, PQ //SR ද වේ. P හා R ලක්ෂ්‍යවල සිට SQ ට ඇඳි ලම්බ පිළිවෙළින් PX හා YR වේ.

**(i)** මෙම රූප සටහන පිටපත් කර ගෙන දී ඇති තොරතුරු එහි ඇතුළත් කරන්න.

**(ii)** PQS$\Delta \equiv$ SQR $\Delta$ බව පෙන්වන්න

**(iii)** PQRS සමාන්තරාස්‍රයක් බව සාධනය කරන්න

**(iv)** PX = RY බව සාධනය කරන්න.




**12.** ABCD යනු සමාන්තරාසයකි සුදුසු රූප සටහනක් ඇඳ,

**(i)** ABC හා ADC $\Delta$ අංගසම බව

**(ii)** AB හා CD සමාන බව

**(iii)** $A\hat{B}C$ හා $A\hat{D}C$ සමාන බව සාධනය කරන්න.

****